## (Beyond the Lutheran Reforms: Reflections on the *Subandi* (lay religious group) life of Spirituality of the *Kithu Dana Pubuduwa* (renewal Movement) that led to Reforms within the Catholic Tradition in Sri Lanka)

### ලූතර් ප්‍රතිසංස්කරණ ඉක්ම ගිය වගයි : සභා නවෝදයකට කඩඉමක් වූ කිතු දන පුබුදු සුබැඳි දිවි දැක්ම

**චමිල තුසිත්***
office@pubuduwa.org

**සංක්ෂේපය**

ක්‍රිස්තියානි සභාවේ ඉතිහාසය අතිසංකීර්ණ ගමනකි. එහෙත් එහි කේන්ද්‍රීය තේමාව දෙවි-මිනිස් සබඳතාවයි. කැපවීම, පරිත්‍යාගිවීම, අත්හැරීම මෙම ගමනෙහි සුවිශේෂ ලක්ෂණය විය. සභා ඉතිහාසය ක්‍රමානුකූලව විකාශනය වන විට පූජක, පැවිදි, ගිහි වශයෙන් විවිධ සීමාවන් තුළ පිළිතුරු දීම සිදුවිය. ලූතර්ගේ ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය මගින් සභාවට අලුත් දැක්මක් පිළිබඳ අරුණලු පහළ වන්නට විය. ලූතර් ප්‍රතිසංස්කරණ හා දෙවන වතිකාන මන්ත්‍රණ සභාවේ ශුද්ධාත්ම නවෝදය ද මුල් ස්ප්‍රීතුව මෙන් ඒ දැවැන්ත ක්‍රියාවලිය නැවත සිදුවීමක් හා සමානය. සභා සම්ප්‍රදාය තුළ මෙතෙක් පැවති පූජක පැවිදි සීමාවෙන් ඉවත් වී ගිහි ජනතාවගේ අවශ්‍යතාව හඳුනා ගත් නිසාම ගිහියාට හිමි තැන ලැබුණි. මෙහි ප්‍රතිඵලය වූයේ ගිහියා නිද්‍රාශීලීව තවත් නොසිට මූලාශ්‍ර ස්ප්‍රීතුව තුළ දේව ජනතාව යළි වරම් ලැබීමකි. ලූතර් ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය මගින් සිදු වූ සභා නවෝද ඉඟිය ද දෙවන වතිකාන මන්ත්‍රණ සභාවේ ශුද්ධාත්ම නවෝදය ද ''සුබැඳි ගිහි සංඝය'' නිර්මාණ කිරීමෙහි පසුබිම් වූ බව විමසීම මෙම පර්යේෂණ ලිපියේ මූලික අරමුණයි.

ශුද්ධාත්මයාණෝ ලූතර් සභා නවෝද ක්‍රියාවලිය සිදු කිරීම පුද්ගල චරිතයන් ලෙස භාවිත විය. කිතු දන පුබුදුවේ උපත සිදුවන්නේ මෙවන් පරිසරයක් තුළිනි. එය ශ්‍රී ලාංකේය ගිහි ජනතාව ලැබූ ජයග්‍රහණයකි. මේ උපත ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය මගින් දෝලනය වීම අපූරු පුවතකි.

මේ නිසාම දෙවන වතිකාන මන්ත්‍රණ සභාවෙන් හඳුන්වා දුන් නවෝදයට පූජක හා පැවිදිවරුන්ට පමණක් සීමා වූ යම් යම් අපෝස්තලික සේවාවන්ට සහභාගී වීමට ගිහි ජනතාවට සහභාගී වීමට හැකි විය. ඒ අනුව සහභාගීශීලී සභාවක් පිළිබඳ අදහස යළි ප්‍රචලිත විය. ඒ තුළින් සාම්ප්‍රදායික පූජකයන්ට පමණක් සීමා වූ අපෝස්තලික ජීවිතය ගිහි ජනතාව තුළ ද සිදුවිය. මෙම ප්‍රතිසංස්කරණයේ ආලෝකය තුළ තරුණ තරුණියන් පිරිසක් නව කිතුනු ප්‍රතිපදාවක් ලෙස 'සුබැඳි සංඝය' වැළඳ ගැනීම සනිටුහන් කරමු.

ලූතර්ගේ ක්‍රියාවලිය හුදෙක් අලුත් දෙයක් නොව ශුද්ධාත්ම නවෝද ප්‍රවාහයට නව මාවතක් විය. එම ප්‍රතිසංස්කරණ ක්‍රියාදාමයේ ඓතිහාසික කලඑළි බැසීම සිදු වූයේ දෙවන වතිකාන කතිකාවත මගින් බව සමහරු අර්ථ දක්වති. අප මෙහි තර්ක කරනුයේ ශ්‍රී ලංකා කතෝලික සභාව තුළ සිදුකළ ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය සඳහා කිතු දන පුබුදු නවෝද ප්‍රවාහ ප්‍රතිසංස්කරණයේ මැදහත්කරුවෙකු ලෙස කටයුතු කළ බවයි. සුබැඳි ජීවිත ක්‍රමය එහි එක් සුවිශේෂ අත්දැකීමක් ලෙස අපි මෙහිලා සඳහන් කරමු.

**මූලික පද** : ශුද්ධාත්ම ක්‍රියාකාරිත්වය, ප්‍රතිසංස්කරණ, අල්පේච්ඡතාව, ගිහි කැපවීම, දේශයට හා ජනතාවට මාංශ ගතවීම, සාංඝික දිවියක්.

---

*රෝමයේ උර්බානියානු සරසවියට අනුබද්ධ කොළඹ අගරදගුරු පදවියේ සාන්ත ජුසේ වාස් දේවධර්ම නිකේතනයේ උපාධිය ද (B.A. (Rome), කැලණිය විශ්වවිද්‍යාලයේ 2014 ක්‍රිස්තියානි අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රපති (M.A. (Kelaniya) උපාධිධාරියෙකු වූ, පුබුදු සංඝයේ සුබැඳි පූර්ණ කාලිකනයෙකි.